# 01 පවුල තුළින් ප්‍රසන්න ජීවන පරිසරයක්

මානව සමාජයේ සෑම පුද්ගලයකු ම අනිවාර්යයෙන් සම්බන්ධ වන, එසේ ම තම ජීවිතය කෙරෙහි දැඩි ලෙස බලපාන මූලික ඒකකය පවුලයි. යම් කෙනෙක් මෙලොව උපත ලබන්නේ පවුල ආශ්‍රය කොට ගෙන ය. ඔහුට සමාජයේ ජීවත් වීමේ දී පවුල වටා සැකසෙන සම්බන්ධතා ඉතා වැදගත් වේ. මානව සම්බන්ධතා ගොඩනැගීමේ අඩිතාලම වනුයේ පවුල් ඒකකයයි. සමාජ ව්‍යූහයේ කුඩා ම සංවිධානාත්මක ඒකකය වශයෙන් ද පවුල හැඳින්විය හැකි ය. පවුලේ සියලු සාමාජිකයින්ගේ කායික, මානසික, සාමාජයීය හා භෞතික අවශ්‍යතා මනාව සපුරා ගැනීමට යහපත් පවුල් පරිසරයක් පවත්වා ගැනීම මෙන් ම ඔවුන් ජීවත් වන නිවස ක්‍රමවත් ව සැලසුම් කිරීම හා සංවිධානය කිරීම වැදගත් වේ. එමඟින් ප්‍රසන්න ජීවන පරිසරයක් ගොඩනගා ගැනීමට හැකි වනු ඇත.

## පවුල

මෙලොව බිහිවන සෑම පුද්ගලයෙකු ම අයත් වන පළමු වැනි සමාජ ඒකකය පවුල වේ. පවුල සමාජයේ කුඩා ම සංවිධානාත්මක ඒකකය යි. කුඩා ම සමාජ ඒකකය වුවත් සමාජය තුළ එයට වැදගත් ස්ථානයක් හිමි වේ. එයට හේතු වන්නේ පුද්ගලයින්ගේ කායික, මානසික, සමාජයීය හා භෞතික අවශ්‍යතා සපුරා ගැනීමට පවුල දායක වන බැවිනි.

'පවුල' යන සංකල්පය වඩාත් පැහැදිලි කර ගැනීම සඳහා විවිධ සමාජ හා මානව විද්‍යාඥයින් විසින් ඉදිරිපත් කර ඇති අදහස් කිහිපයක් විමසා බලමු.

- මානව පවුල යනු ඥාතීත්ව සමූහයක එකතුවකි.
- විවාහක යුවළ හා ඔවුන්ගේ දරුවන්ගෙන් යුත් සමාජ ඒකකය පවුල ලෙස හැඳින්විය හැකි ය.
- 'පවුල' යනු ආර්ථික වශයෙන් හා දරුවන් හදාවඩා ගැනීමේ දී සහයෝගී ව කටයුතු කරන, පොදු නිවසක් තුළ ජීවත් වන විවාහක යුවළක් හෝ පිරිපුන් වයසැති ඥාතීන් සිටින ඒකකයකි (කැත්ලීන් ගෆ්).
- 'පවුලක් යනු ජීවත් වීමට අවශ්‍ය ඉඩ ප්‍රමාණය සහ මුලාශ්‍ර, සම්පත්, බෙදහදා ගනිමින් කාලයක් තිස්සේ එක ම ඉලක්කයක් කරා යාමට සංවිධානය වන, එකිනෙකා අතර බලපෑමක් ඇති කරන පුද්ගලයින්ගෙන් සමන්විත සහයෝගී ඒකකයකි' (හොක් සහ පැවොලුසි).



නොමිලේ බෙදාහැරීම පිණිසයි.

ඉහත දැක්වූ අදහස් අනුව,

**දෙමාපියන්, දරුවන් හා වෙනත් ඥාතීන්ගෙන් සමන්විත, අන්‍යෝන්‍ය සබඳතා හා බැඳුණු සුවිශේෂී කාර්යභාරයන් ඉටු කරන එක ම ඉලක්කයක් කරා යාමට සංවිධානය වන ඒකකය 'පවුල' යනුවෙන් හැඳින්විය හැකි ය.**

ඔබ පවුලේ හෝ ඔබ දන්නා වෙනත් පවුල් කිහිපයක ජීවත්වන සාමාජිකයින් පිළිබඳ ව මතකයට නගා ගන්න. ඒවායින් සමහර පවුල්වල සිටිනුයේ දෙමාපියන් හා දරුවන් පමණක් බව ඔබට පෙනීයන්නට ඇත. එමෙන් ම දෙමාපියන් හා දරුවන්ට අමතර ව මව් පාර්ශවයේ හෝ පිය පාර්ශවයේ ලේ ඥාතීන් ද ඔවුන් සමග ජීවත් වන ආකාරය ඇතැම් පවුල් තුළ ඔබ දකින්නට ඇත. මෙවැනි සුවිශේෂී ගතිලක්ෂණ පදනම් කරගෙන මානව හා සමාජ විද්‍යාඥයින්, පවුල් ප්‍රධාන ස්වරූප දෙකකින් දක්වා ඇත.

- න්‍යෂ්ටික පවුල
- විස්තෘත (විස්තාරිත) පවුල

## න්‍යෂ්ටික පවුල




1.1 රූපය - න්‍යෂ්ටික පවුල

1.1 රූපය හොඳින් නිරීක්ෂණය කරන්න. එහි දක්වෙන්නේ දෙමාපියන් හා දරුවන්ගෙන් පමණක් සැදුම් ලත් පවුලක් බව ඔබට පෙනෙනවා ඇත. මෙම පවුල න්‍යෂ්ටික පවුල යනුවෙන් හැඳින්වේ. න්‍යෂ්ටික පවුල, පරම්පරා දෙකකට පමණක් (දෙමාපියන් හා දරුවන්) සීමා වූවකි.

කෘෂිකාර්මික ජීවන රටාවක් අනුව සරල ලෙස ජීවත් වූ ජනතාව විවිධ සමාජ ආර්ථික හේතූන් නිසා නාගරීකරණය විය. මේ නිසා වර්තමානයේ නගර ආසන්නයේ න්‍යෂ්ටික පවුල් වැඩිපුර දක්නට ඇත. විවිධ සමාජ හා මානව විද්‍යාඥයින් න්‍යෂ්ටික පවුල විවිධ නම්වලින් හඳුන්වා දී ඇත.

- ප්‍රාථමික පවුල
- සමීප පවුල
- ඒකීය පවුල
- මූලික පවුල
- අණු පවුල

## න්‍යෂ්ටික පවුලේ ව්‍යුහය පහත සඳහන් සටහන තුළින් හඳුනා ගන්න




න්‍යෂ්ටික පවුලක් ලෙස ජීවත් වීමේදී ලබන අත්දැකීම් පිළිබඳ ව දැන් අපි විමසා බලමු. න්‍යෂ්ටික පවුලේ සාමාජික සංඛ්‍යාව අඩු බැවින් සාමාජිකයින්ගේ ස්වාධීනත්වය මෙන් ම පෞද්ගලිකත්වය ආරක්ෂා වීම ද කැපී පෙනෙන ලක්ෂණයකි. එහෙත් පවුලේ ආරක්ෂාව පිළිබඳ ගැටලු මතුවිය හැකි ය.

උදාහරණ :-


- බොහෝ විට දෙමාපියන් රැකියාවට යාමේ දී කුඩා දරුවන් රැකබලා ගැනීමේ අපහසුතා නිසා මෙහෙකරුවන්ට මෙන් ම දිවා සුරැකුම් මධ්‍යස්ථානවලට දරුවා භාර දීමට සිදු වීම.
- දෙමාපියන් අසනීප වූ අවස්ථාවක හෝ දෙදෙනාගෙන් එක් අයෙකුට නිවෙසින් බැහැර වීමට සිදුවූ අවස්ථාවලදී ද විවිධ ගැටලුවලට මුහුණ දීමට සිදු වීම.

දරුවෙකු වැඩිහිටියෙකු බවට පත්වන විට නොයෙක් මානසික ප්‍රශ්නවලට මුහුණ දීමට අවශ්‍ය ශක්තිය ඇති කළ හැකි වන්නේ කුඩා කළ පවුලෙන් ලබන අත්දැකීම් තුළිනි. මේ නිසා මව්පියන් හා දරුවන් අතර සම්බන්ධතාව දරුවාගේ පෞරුෂ වර්ධනයට ප්‍රබල ලෙස බලපාන සාධකයක් ලෙස දැක්විය හැකි ය.

න්‍යෂ්ටික පවුලක් තුළ සාකච්ඡා මාර්ගයෙන් ගැටලු විසඳා ගැනීමට යාමේ දී පහසුවෙන් තීරණ ගැනීමට හැකි වේ. එමෙන් ම වෙනත් වැඩිහිටි ඥාතීන් මෙම පවුලේ නොමැති නිසා වැඩිහිටි පරම්පරාව හා අදහස් ගැටීම් අවම වේ. න්‍යෂ්ටික පවුලේ සාමාජිකයින් තුළ ඇතැම් විට ආත්මාර්ථකාමී බව දක්නට ඇත.

ජී. පී. මර්ඩොක් ( G. P. Murdock ) නම් ඇමෙරිකානු මානව විද්‍යාඥයා න්‍යෂ්ටික පවුලක පුද්ගලාන්තර සම්බන්ධතාව පිළිබඳ මෙසේ අදහස් දක්වා ඇත.

- ස්වාමිපුරුෂයා සහ භාර්යාව අතර සම්බන්ධය
- පියා සහ මව අතර සම්බන්ධය
- පියා සහ දුව අතර සම්බන්ධය
- පියා සහ පුතා අතර සම්බන්ධය
- මව සහ පුතා අතර සම්බන්ධය
- මව සහ දුව අතර සම්බන්ධය
- සහෝදරයා සහ සහෝදරිය අතර සම්බන්ධය
- සහෝදරිය සහ සහෝදරයා අතර සම්බන්ධය



1.2 රූපය - න්‍යෂ්ටික පවුල තුළ පුද්ගලාන්තර සම්බන්ධතා

මෙසේ පවුලේ සාමාජිකයන් අතර පවතින සම්බන්ධතා පවුලේ සුහදතාවට බෙහෙවින් ඉවහල් වන බව ද පෙන්වා දිය හැකි ය.

## විස්තෘත පවුල




1.3 රූපය - විස්තෘත පවුල

විස්තෘත පවුලක, දෙමාපියන් හා දරුවන්ට අමතර ව වෙනත් ලේ ඥාතීන් ද සිටිය හැකි ය. එනම් මව් පාර්ශවයේ මෙන් ම පිය පාර්ශවයේ ඥාතීන් ය. මෙහි දක්වෙන 1.3 පින්තූරය නිරීක්ෂණය කිරීමෙන් ඔබට තව දුරටත් එය පැහැදිලි කර ගත හැකි වේ. පරම්පරා තුනක හෝ හතරක සාමාජික සංඛ්‍යාවක් ද වුව ද සිටිය හැකි ය.

මානව හා සමාජ විද්‍යාඥයන් විස්තෘත පවුල ද විවිධ නම්වලින් අවස්ථාවෝචිත ව හඳුන්වා දී ඇත.

- සංයුක්ත පවුල
- ව්‍යාප්ත පවුල
- බද්ධ පවුල
- විස්තාරිත පවුල
- විස්තීරණ පවුල

## විස්තෘත පවුලේ ව්‍යුහය පහත සඳහන් සටහන තුළින් හඳුනා ගන්න




විස්තෘත පවුලක ජීවත් වීමේ දී ලබන අත්දැකීම් පිළිබඳ ව දැන් අපි විමසා බලමු. ඒ අනුව විස්තෘත පවුලේ වැඩි සාමාජික සංඛ්‍යාවක් සිටින බැවින් සාමාජිකයින් අතර අන්‍යොන්‍ය බැඳීම, සහයෝගය, සුරක්ෂිතභාවය වැඩි වශයෙන් ඇති බව පෙනේ. එමෙන් ම මව්පස හා පියපස ඥාතීන් ද මෙම පවුලේ වෙසෙන බැවින් පවුලේ අවධානය තම දරුවන්ට පමණක් සීමා නොවී වැඩිහිටි පරම්පරාව සහ බාල පරම්පරාව යන දෙපිරිසට ම පොදුවේ යොමු වේ. මේ නිසා මෙම පවුලේ සාමාජිකයන් තුළ

- බෙදාහදා ගැනීම
- ත්‍යාගශීලී බව
- පරාර්ථකාමී බව
- ඉවසිලිවන්ත බව
- ආරක්ෂිත බව

වැනි යහපත් ගති ලක්ෂණ ඇති බව පිළිබිඹු කරයි.

සාමාජික සංඛ්‍යාව වැඩි නිසා සාමාජිකයන්ගේ ස්වාධීනත්වය අඩුවේ. විවිධ අවස්ථාවල දී තීරණවලට එළඹීම අපහසු වේ. පෞද්ගලිකත්වයට ඉඩ ප්‍රස්තා අඩු වේ. ඇතැම්විට වැඩිහිටි හා බාල පරම්පරා අතර අදහස් ගැටීම් ද ඇති විය හැකි ය.

විස්තෘත පවුල සිංහල ජන සමාජයේ ඉතා අගය කොට සලකන ලද පවුල් ඒකකයකි. එකල ගොවි පවුලේ කෘෂිකාර්මික ආර්ථික ක්‍රියාවලිය සාර්ථක අන්දමින් පවත්වා ගෙන යාමට විස්තෘත පවුලෙන් විශාල අනුබලයක් ලැබුණි.

විශේෂයෙන් පවුල තුළින් ම වැඩි ශ්‍රම සැපයුමක් ලැබීමත් ආර්ථික ප්‍රතිලාභ පවුල තුළ සම සේ භුක්ති විඳීමත් විස්තෘත පවුලේ ආවේණික ලක්ෂණ විය. වර්තමානයේ ද ඇතැම් ග්‍රාමීය ප්‍රදේශවල මෙම විස්තෘත පවුල් ඒකක බහුල ව දක්නට ඇත. නගරයට ආසන්නයේ මෙවැනි පවුල් ඒකක විරල බවක් පෙනේ.

පවුල හෙවත් පවුල් ඒකක විවිධ අවධි පසු කරයි. පවුලක පැවතුම් කාලය ප්‍රධාන අවධි තුනක් යටතේ දැක්විය හැකිය.

- ආරම්භක අවධිය
- වර්ධක අවධිය
- සංකෝචන අවධිය

පහත දැක්වෙන සටහන හොඳින් නිරීක්ෂණය කිරීමෙන් එම අවධි පිළිබඳ ව මනා අවබෝධයක් ලබා ගත හැකි ය.

ආරම්භක අවධිය



→ නව යුවළ එකිනෙකා සහ දෙදෙනාගේ නව ඥාතීන්ට අනුව හැඩ ගැසෙන අවධියයි. පළමු දරුවා ලැබීමෙන් පසු ආරම්භක අවධිය අවසන් වේ.

වර්ධක අවධිය



→ විවාහ වී පළමු දරුවා ලැබීමෙන් පසු වර්ධක අවධිය ආරම්භ වේ. දරුවන් විවාහ වී නිවෙසින් වෙන් වී යාමෙන් වර්ධක අවධිය අවසන් වේ.

සංකෝචන අවධිය




→ පවුලේ දරුවන් විවාහ වී නිවෙසින් වෙන් ව ගිය පසු දෙමාපියන් තනි වන අවධියයි. දෙදෙනාගෙන් එක් අයෙකු මිය ගිය පසු තනි ව එම ජීවිතයට හැඩ ගැසීමට සිදුවේ.

## පවුල් ඒකකයේ වැදගත්කම

පවුල පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී පවුල් ඒකකයේ වැදගත්කම පිළිබඳව ද අවධානය යොමු කළ යුතු ය. පවුලේ සාමාජිකයින්ගේ අන්‍යෝන්‍ය සබඳතා මැනවින් ගොඩ නගා ගැනීමෙන් නිවසේ විවිධ කාර්යයන් පහසුවෙන් ඉටුකර ගැනීම වඩා පහසු වනු ඇත.

පවුලක් තුළින් එහි සාමාජිකයින්ගේ කායික, මානසික, සමාජයීය හා භෞතික අවශ්‍යතා සපුරා ගැනීමට හැකිවන බැවින් පවුල් ඒකකය ඉතා වැදගත් වේ. මීට අමතර ව තම සංස්කෘතිය පවරා දීම, මානව සංහතියේ පැවැත්ම තහවුරු කිරීම ද පවුල තුළින් ඉටු විය යුතු ඉතා වැදගත් අවශ්‍යතාවන් වේ.

පහත දැක්වෙන සටහන හොඳින් නිරීක්ෂණය කිරීමෙන් පවුලේ සාමාජිකයන්ගේ අවශ්‍යතා පවුල තුළින් සපුරා ගන්නා ආකාරය පිළිබඳ ව ඔබට පහසුවෙන් අවබෝධ කර ගැනීමට හැකි වනු ඇත.




1.4 රූපය - පවුලේ අවශ්‍යතා සපුරාලීම

1.4 රූපයෙන් දැක්වෙන තොරතුරු පිළිබඳ ව විමසා බැලීමේ දී ඔබට හැඟී යන්නේ කුමක් ද ?


එය සශ්‍රීක ව වර්ධනය වූ ශාකයක් බව ඔබට පැහැදිලි වනු ඇත. ආහාර, ජලය, උෂ්ණත්වය හා හිරුඑළිය ප්‍රමාණාත්මක ව ශාකයට ලැබීමෙන් එහි මුල් ශක්තිමත් වී මලින්, ඵලින් බර වූ ශාකයක් ලෙස වර්ධනය වන බව ඔබ ඉගෙන ඇත. එමෙන් ම මෙම පවුල නමැති ශාකය සශ්‍රීක වන්නේ ප්‍රධාන මූලයන්ගේ අවශ්‍යතා වන සාමාජිකයන්ගේ මූලික අවශ්‍යතා එනම් කායික අවශ්‍යතා, මානසික අවශ්‍යතා, සාමාජයීය හා භෞතික අවශ්‍යතා නිසි ලෙස සපුරාලීමෙනි. ඒ අනුව ප්‍රසන්න ජීවන පරිසරයක් ගොඩනගා ගැනීම සඳහා පවුල දායක වන ආකාරය ඔබට පැහැදිලි වන්නට ඇත. එසේ ම පවුලේ සාමාජිකයන් සතු යුතුකම් හා වගකීම් පිළිබඳ ව අවබෝධය ද ඉතා වැදගත් ය.

## පවුල සතු යුතුකම් හා වගකීම්

නවීන විද්‍යාවේ හා තාක්ෂණයේ දියුණුවත් සමග ශීඝ්‍රයෙන් වෙනස් වන සමාජය තුළ ජීවත් වීමේ රටාව ද වෙනස් වෙමින් පවතියි. අතීතයේ නිවසේ වැඩි වගකීම ගෘහණිය වෙත පැවරී තිබුණ ද වර්තමානයේ එය ක්‍රමයෙන් වෙනස් වෙමින් පවතී. වර්තමාන සමාජයේ බිරිඳ ද රැකියාව සඳහා නිවෙසින් බැහැරව යන බැවින් පවුලේ කාර්ය පිළිබඳ වගකීම සෙසු සාමාජිකයන් අතර බෙදී යෑමක් දක්නට ඇත. එවන් වාතාවරණයක් තුළ නිවෙස ප්‍රසන්න සුවදායි ස්ථානයක් කර ගැනීමේ වගකීම පවුලේ සියලු සාමාජිකයින් වෙත පැවරී ඇත. ඒ අනුව නිවසේ සාමාජිකයින් සතු යුතුකම් හා වගකීම්වල ද වෙනසක් පවතින බව ඔබට වැටහෙනු ඇත.

පියා, මව සහ දරුවන් ආදී වශයෙන් විවිධ භූමිකා නිරූපණය කරන පවුලේ සාමාජිකයින් සියලු දෙනා ම පවුලේ පොදු අරමුණු මුදුන්පත් කර ගැනීම සඳහා ක්‍රියා කරති. පවුලේ දියුණුව, සමගිය වැනි පොදු කරුණු මෙන් ම පවුලේ යම් යම් සිරිත් විරිත් ආදිය ගොඩනගා ගෙන ඇත්තේ ද අරමුණු ඉටුකර ගැනීමේ පහසුව සඳහා ය. පවුලේ සාමය, සමගිය, දියුණුව රඳා පවතින්නේ මේ සියල්ල අතර අන්‍යෝන්‍ය සම්බන්ධතා අවබෝධ කරගෙන ක්‍රියා කිරීම තුළිනි.

පහත දැක්වෙන සටහන නිරීක්ෂණය කිරීමෙන් පවුලේ අන්‍යෝන්‍ය යුතුකම් හා වගකීම් පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකි වනු ඇත.




ස්වාමිපුරුෂයාගෙන් භාර්යාවට හා භාර්යාවගෙන් ස්වාමිපුරුෂයාට ද, ඔවුන් දෙමාපියන් වූ පසු දරුවන්ට ද, දරුවන්ගෙන් තම දෙමාපියන්ට ද,සහෝදරයාගෙන් සහෝදරියට ද, සහෝදරියගෙන් සහෝදරයාට ද, පවුල තුළින් සමාජයට ද, අන්‍යෝන්‍ය වශයෙන් ඉටුවිය යුතුකම් හා වගකීම් ඇත. ඒවායින් කිහිපයක් පහත සටහන්වල දක්වා ඇත.

### පවුලේ සමාජිකයන් විසින් ඉටුකළ යුතු යුතුකම් හා වගකීම්

**ස්වාමිපුරුෂයාගෙන්**



**භාර්යාවගෙන්**



- තමාගේ සහකරු හෝ සහකාරිය ගෞරවණීය ලෙස පිළිගැනීම
- පවුලේ සාමාජිකයන්ගේ අවශ්‍යතා සපුරාලීම
- ප්‍රියමනාප වචනයෙන් කථා කිරීම
- ආරක්ෂයෙකු ලෙස කටයුතු කිරීම
- දෙපාර්ශ්වයේ ම ඥාතීන්ට යහපත් අයුරින් සැලකීම
- ගෘහ කාර්යවලදී දෙදෙනා ම එකතු වී කටයුතු කිරීම
- දරුවන් රැකබලා ගැනීම
- බිරිඳ සැමියාටත්, සැමියා බිරිඳටත් විශ්වාසවන්ත වීම




දෙමව්පියන්ගෙන් දරුවන්ට






- දරුවන්ගේ අවශ්‍යතා සපුරාලීම
- නිසි පෝෂණය ලබාදීම
- ඉගෙනීමට පහසුකම් සැලසීම
- යහපත් පුරුදු හා ආකල්ප ඇති කිරීම
- යහපත් ක්‍රියාවෙහි නිරත කරවීම
- රෝගී අවස්ථාවලදී රැකබලා ගැනීම
- සුරක්ෂිතභාවය ලබාදීම
- පූර්ණ පෞරුෂයකින් යුතු හොඳ පුරවැසියෙකු කිරීමට වෙහෙස වීම
- සුදුසු කාලයේදී දයාද පවරා දීම
- දේපළ ආරක්ෂා කිරීමට හුරු කරවීම






දරුවන්ගෙන් දෙමව්පියන්ට

- බාල අවධියේ හැකි උපරිම අයුරින් ඉගෙනීමේ කටයුතුවල නිරත වීම
- දෙමාපියන්ට හා වැඩිහිටියන්ට ගරු කිරීම
- පවුලේ සාමාජිකයින් ලෙස හැකි උපරිම අයුරින් පවුල තුළ වගකීම් දැරීම
- වියපත් මව් පියන් පෝෂණය කිරීම හා ආරක්ෂා කිරීම
- මව් පියන්ගෙන් ලැබුණු දේපළ ආරක්ෂා කිරීම හා නිවැරදි ව භුක්ති විඳීම
- තම පරපුර රැක ගැනීම
- පවුලේ ආර්ථිකයට බරක් නොවන ලෙස අරපිරිමැසුම්දායි ලෙස කටයුතු කිරීම
- පවුලේ ගෞරවයට හානිවන කටයුතුවල නිරත නොවීම



**සහෝදරයාගෙන් සහෝදරියට**



- වැඩිමහල් සහෝදර සහෝදරියන් විසින් තම බාල සහෝදර සහෝදරියන් රැකබලා ගැනීම
- ආදර්ශවත් වීම හා ආදර්ශ අනුගමනය කිරීම
- කීකරු වීම හා ගරු කිරීම
- වැඩිහිටි සහෝදර සහෝදරියන් විසින් බාල සහෝදර සහෝදරියන් හට යහපත් ක්‍රියාවෙහිලා මග පෙන්වීම
- ගෘහ කාර්යයන්වල දී එකිනෙකාට උදව් කිරීම
- අධ්‍යාපන කටයුතුවල දී එකිනෙකාට සහයෝගය ලබාදීම



**සහෝදරියගෙන් සහෝදරයාට**

### පවුලෙන් සමාජයටත්, සමාජයෙන් පවුලටත් ඉටු විය යුතු යුතුකම් හා වගකීම්

- පවුල ප්‍රධාන ඒකකයක් ලෙස සමාජය පිළිගැනීම
- කායික, මානසික, චිත්තවේගික හා සමාජයීය වශයෙන් වර්ධනය වූ සමබර පෞරුෂයක් ඇති දරුවෙකු සමාජයට ඉදිරිපත් කිරීම
- සමාජය තුළ සාමය, සතුට ආරක්ෂා කර දීමට දායක වීම
- සමාජයේ විවිධ කටයුතුවලදී පවුල ක්‍රියාකාරී ලෙස කාර්යයන් ඉටු කිරීම
- රැකියාව හෝ වෘත්තිය ඉතා අවංක ව හා උපරිම අයුරින් ඉටු කිරීම
- අසල් වැසියන් ගේ හා ඥාතින්ගේ අවශ්‍යතාවල දී උපකාර කිරීම

මෙවන් යුතුකම් හා වගකීම් නිසි ලෙස ඉටු කිරීම යහපත් පවුල් පරිසරයක් ඇති වීම කෙරෙහි බලපායි. මෙතෙක් ඔබ උගත් කරුණු තුළින් ප්‍රසන්න ජීවන පරිසරයක් ඇති කිරීම සඳහා එවැනි පවුලක දායකත්වය කොතරම් ඉවහල් වන්නේ ද යි ඔබට දැන් අවබෝධ වන්නට ඇත.

**සාරාංශය**

පවුල සමාජයේ කුඩා ම සංවිධානාත්මක ඒකකයි. පවුලේ සාමාජිකයින්ගේ කායික මානසික, සාමාජීය හා භෞතික අවශ්‍යතා මනාව සපුරාලීම තුළින් ප්‍රසන්න ජීවන පරිසරයක් ගොඩනගා ගත හැකි ය. පවුලේ සාමාජිකයින් ලෙස ඔබ හැම තම යුතුකම් හා වගකීම් නිසි ලෙස ඉටු කරමින් ප්‍රසන්න පවුල් පරිසරයක් ඇති කරලීම සඳහා දායක විය යුතු ය.

**ක්‍රියාකාරකම 1.1**

පහත දැක්වෙන තේමා අධ්‍යයනය කර ප්‍රසන්න පවුල් පරිසරයක් ඇති කිරීමෙහිලා පවුලේ දයකත්වය අලළා කෙටි නාට්‍යයකට තිර පිටපතක් ලියා පන්තියට ඉදිරිපත් කරන්න.

- මෙම පවුලේ දෙමාපියන්, මුල් ළමා වියේ දරුවකු, යොවුන් වියේ පුතෙකු හා මිත්තණිය ද නිවසේ එකට ජීවත් වේ යැයි උපකල්පනය කරන්න.
- පවුලේ සියලු ම කාර්යයන් මවට තනිව ම කිරීමට සිදුවන බැවින් ඇය වෙහෙසට පත් වේ.
- මිත්තණිය, මුනුබුරන් හා මිනිබිරියන්ගේ සුභසිද්ධිය පිළිබඳ ව සොයා බලයි.
- මව සහ පියා සෑම සති අන්තයේ ම වෙළෙඳ සැලට ගොස් පවුලට අවශ්‍ය බොහෝ ද්‍රව්‍ය රැගෙන එති.
- දරු දෙදෙනා සති අන්තයේ මවගේ හා පියාගේ කාර්යයන්ට සහාය දක්වති.
- ප්‍රසන්න ජීවන පරිසරයක් ඇතිකර ගැනීමට දෙමාපියෝ වෙහෙස දරති.

**අභ්‍යාසය 1.1**

01. 'පවුල' අර්ථ දක්වන්න.
02. න්‍යෂ්ටික හා විස්තෘත පවුල්වල ලක්ෂණ සංසන්දනය කරන්න.
03. ප්‍රසන්න ජීවන පරිසරයක් ඇති කර ගැනීම සඳහා පවුලේ කායික, මානසික සමාජයීය හා භෞතික අවශ්‍යතා සපුරා ලීමේ වැදගත්කම පිළිබඳ ව ඔබේ අදහස් පැහැදිලි කරන්න.